බන්ධ:කොප: චක්‍රලේඛ අංක :14 /2012

මගේ අංක:කේ.3/විවිධ/2012,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2012.04. 11 වෙනි දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

## බන්ධනාගාර ආයතනතුල විවිධ ප්‍රසංග පැවැත්වීම

බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ට හා සැකකරුවන්ට සිංහල හින්දු අළුත් අවුරුද්ද නිමිත්තෙන් සීමා කිරීමකින් තොරව අමුත්තන් බැලීමට අවස්ථාව ලබාදීම අනුව, එම දිනවල බන්ධනාගාර ආයතන අවට බහුල වශයෙන් මහජනතාව ඒකරාශීවේ.

මෙම පිරිස් අතර, විවිධ පුද්ගලයන් අයථා කටයුතුවල නිරතවීම සඳහා නොයෙකුත් හේතූන් දක්වමින් බන්ධනාගාරතුලට ප්‍රවිෂ්ඨ වීමටත් නීති විරෝධී භාණ්ඩ හා ද්‍රව්‍ය ඇතුලට ගෙනයාමටත්, ඒ සඳහා ඔවුන් පැමිණෙන වාහන ඇතුලට ගැනීමටත්, ප්‍රයත්න දැරීමට ඉඩ ඇති බැවින්, බන්ධනාගාර ආයතනවල ආරක්ෂක කටයුතු මනාව පවත්වා ගෙන යාම සඳහා එවැනි ක්‍රියාවන් සිදු නොවීමට පියවර ගැනීමට ආයතනගාර අධිකාරීවරුන් විසින් කටයුතු කල යුතුය.

තවද, මෙවන් උත්සව අවස්ථාවලදී සිදුවිය හැකි අක්‍රමිකතා අවමකර ගැනීම සඳහා පිටස්තර පුද්ගලයන්ට බන්ධනාගාරතුලට ප්‍රවිෂ්ඨවී විවිධප්‍රසංග පැවැත්වීමට අවසර ලබාදීම සීමා කල යුතුය. මෙවන් උත්සව බන්ධනාගාරවල පවත්වන අවස්ථාවලදී යම් යම් වැරදි ප්‍රචාරයන් ඇති විය හැකි බැවින්, එයද සැලකිල්ලට ගෙන ආරක්ෂක පියවරක් වශයෙන්, එවැනි ප්‍රසංගයක් හෝ සංදර්ශණයක් පැවැත්වීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා දින 14 කට පෙර ඒ පිළිබදව එම වැඩ සටහන දියත් කරන ආකාරය, ස්ථානය, සහභාගි කරවන නේවාසිකයින්, සහ පැමිණීමට බලාපොරොත්තු වන පිටස්තර පුද්ගලයන් පිළිබද විස්තර සහ ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංකද සහිතව සැලසුම්කර ඇති ආරක්ෂක පියවර යන්ද, ඇතුලත් සවිස්තර වාර්තාවක් මා වෙත එවා ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

තවද, මේ පිළිබදව අධිකාරී නියෝගයක් මගින් සියළු නිලධාරීන් දැනුවත් කිරීමටද ඔබ විසින් වගබලා ගත යුතුය.

පී.ඩබ්ලිව්.කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.